# සංක්ෂිප්තය

විවිධ වූ සමාජ ආර්ථික පසුබිම්වලට අයත් සිසුන් ග්‍රාමීය මෙන්ම නාගරික 1AB සහ 1C පාසල්වල ඉගෙනුම ලබයි. මෙම විවිධ සමාජ ආර්ථික පසුබිම්වලට අයත් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන්ට තම අනාගතය පිළිබඳ යම් යම් අපේක්ෂාවන් පවතී. එහිදී මෙම සිසුන්ට තමා අභිමත ඉලක්කය වෙත යාමට එම විෂයයන් පිළිබඳ යම් වරණයක් හෙවත් තේරීමක් කිරීමට සිදු වේ. මෙම තේරීම ඔහුගේ හෝ ඇයගේ අනාගත වෘත්තීය අපේක්ෂාවන් මුල් කර ගත්තක් විය යුතුය.

මෙම විෂයයන් තේරීමේදී සිසුවා අයත් සමාජ ආර්ථික පසුබිම ද ඔවුන්ට යම් බලපෑමක් එල්ල කරන එක් සාධකයක් වේ. සිසුවා අයත් සමාජ පන්තිය මත පදනම් වී තම වරණය සිදු කිරීම සමහර අවස්ථාවලදි මතු වී පෙනේ. නමුත් මෙහි දී බෙහෙවින් ම වැදගත් වනුයේ ශිෂ්‍යයාගේ කැමැත්ත, හැකියාව මත තම වරණය සිදු කිරීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමයි. නමුත් අද්‍යතන අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් එම අවස්ථාවන් දරුවාට අහිමි කර ඇති බවක් පෙනේ.

අධ්‍යාපන සම අවස්ථා සංකල්පය මෙහිදී ඉතා වැදගත් සංකල්පයකි. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ දරුවාට තම වරණයේදී සමාන අවස්ථා උදා වී ඇත්ද යන්න ගැටලුවක් වී පවතී. සෑම සිසුවකුට ම සමාන අවස්ථා සලසා දීම සැබැවින් ම සිදු විය යුත්තක් වුව ද අද වන විට එම සංකල්පය නො නිමි කර්තව්‍යයක් බවට පත්ව ඇති බවක් පෙනේ.

මෙහි පළමු පරිච්ඡේදය මගින් අධ්‍යයන ගැටලුව පිළිබඳව හැඳින්වීමක් කර ඇති අතර, මෙම අධ්‍යයනයේ කාලීන වැදගත්කම ද අවධාරණය කර ඇත. අධ්‍යයනය සඳහා යොදා ගත් ක්‍රම ශිල්ප හා ඒ ආශ්‍රිත ගැටලු ද මතු කර දක්වා ඇත. එසේම අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුවා විෂයයන් තෝරාගෙන ඇති ආකාරය හා ඔවුන්ගේ වෘත්තීය අපේක්ෂණ අතර සබඳතාව සෙවීමේදී ඒ සඳහා බලපාන සාධක කිහිපයක් ඇත. එම සාධක කිහිපය ද අනාවරණය වන ලෙසින් අධ්‍යයනයට අදාළ වන පරිදි පද කිහිපයක් නිර්වචනය කර දැක්වීම ද සිදු කර ඇත.

සිසුන් අයත් සමාජ ආර්ථික පසුබිම, ග්‍රාමීය හා නාගරික බව අනුව වෘත්තිය අපේක්ෂණයන්හි පවතින වෙනස්කම්, පාසල් වර්ග අනුව වෘත්තිය අපේක්ෂණයන්හි පවතින වෙනස්කම්, ස්ත්‍රී පුරුෂභාවය අනුව වෘත්තිය අපේක්ෂණයන්හි පවතින වෙනස්කම්, විෂයයන් තේරීම සහ වෘත්තීය අපේක්ෂණ යන සංසිද්ධීන් පිළිබඳ කරුණු අනාවරණය කිරීමට මෙම අධ්‍යයනයේ දෙවන පරිච්ඡේදය වෙන් කර ඇත. විවිධ පර්යේෂණයන්හි සාරාංශයන් ආශ්‍රය කර ගනිමින් පර්යේෂණයට අදාළ වන ආකාරයට එම කරුණු පැහැදිලි කර ඇත.

තෙවන පරිච්ඡේදය මගින් අධ්‍යයනයේ අරමුණු, නියැදිය පිළිබඳ විසිතර, දත්ත රැස්කිරීමේ ක්‍රම ශිල්ප හා උපකරණ, දත්ත විශ්ලේෂණයට යොදා ගත් ක්‍රම ශිල්ප, පර්යේෂණය මෙහෙයවීම, අධ්‍යයනයේ සීමා සහ පර්යේෂණ ක්ෂෙත්‍රයේ සීමා පිළිබඳව කරුණු විග්‍රහ කර ඇත.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික පරිසරයන්හි පවත්නා විවිධ ලක්ෂණ අධ්‍යාපනය හා සම්බන්ධ කර විමසීමට ලක් කළ හැකිය. විවිධ පර්යේෂණ මගින් ද ඒ බව පෙන්වා දී ඇත. විශේෂයෙන්ම සමාජ ආර්ථික පසුබිම විවිධ සංරචක කෙරෙහි බලපාන බව පෙනී ගොස් ඇත. මෙම අධ්‍යයනයේදී ද විෂයය ධාරා හා විෂයයන් තේරීමේදීත් වෘත්තීය අපේක්ෂණවලදීත් මෙම සමාජ ආර්ථික පරිසරය විසින් සිදු කර ඇති බලපෑම් පිළිබඳ පෙන්වා දී ඇත. වෘත්තීය අපේක්ෂණවලදී ද පුම්තිරි බව, ග්‍රාමීය නාගරික බව, පාසල් වර්ගය ආදී සාධක යම් යම් බලපෑම් එල්ල කර ඇති බව පෙනේ. මෙම පුම්තිරි බව, ග්‍රාමීය නාගරික බව, හා පාසල් වර්ගය අනුව වෘත්තිය අපේක්ෂණයන්හි පවතින වෙනස්කම් ද, විෂයයන් තේරීම සහ වෘත්තීය අපේක්ෂණ අතර සබඳතාව පිළිබඳවත් විමසීමට ලක් කර ඇති අතර මෙම සබඳතාව තුළින් පැන නැගී ඇති ගැටලු සිව්වන පරිච්ඡේදය තුළින් අනාවරණය කොට ඇත.

මෙම අධ්‍යයනය සඳහා යොදා ගත් ග්‍රාමීය සහ නාගරික නියැදි තුළ විවිධ ගැටලු රැසක් අනාවරණය විය. එහිදී පාසල සම්බන්ධ සාධක බොහොමයක් සිසුනට ගැටලු ඇතිකර තිබූ බව පෙනුණි. මානව සහ භෞතික සම්පත්හි ඌනතා, කාලසටහන්හි නොගැලපීම්, විෂයයන්හි සීමාකම් ආදී ගැටලු ඒ අතරින් කැපී පෙනුණි. එම තත්ත්වයන් ද සවිස්තරාත්මකව පෙන්වා දී ඇත.

එසේම සිසුවා සම්බන්ධ සාධකයන් ද මෙම විෂයයන් තේරීමට බලපෑමක් සිදු කර ඇති බව පෙනෙන්නට තිබුණි. සිසුන්ගේ ආර්ථික දුෂ්කරතා, සමහර විෂයයන් පිළිබඳ සිසුන් තුළ පවතින ඍණාත්මක ආකල්ප ආදිය මෙහිදී කැපී පෙනුණු ගැටලු විය.

පස්වන පරිච්ඡේදය මගින් විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයට අනුව ලබා ගත් නිගමන කිහිපයක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව සිසුන් අයත් පවුල්වල සමාජ ආර්ථික පසුබිම එම සිසුන්ගේ විෂයයන් තේරීමට යම් ආකාරයක බලපෑමක් සිදු කර ඇති බව අනාවරණය විය. එහිදී දෙමාපිය ආදායම සහ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම සිසුවාගේ විෂයයන් තේරීමට ඍජු බලපෑමක් ඇති කර තිබුණ ද දෙමාපිය රැකියාව සිසුවාගේ විෂයයන් තේරීමට කිසිම ආකාරයකින් බලපෑමක් සිදු කොට නොමැති බව හෙළි විය. පාසල සම්බන්ධ සාධක සිසුන්ගේ විෂයයන් තේරීමට අවම බලපෑමක් සිදු කර ඇති බව ප්‍රශ්නාවලී තුළින් හෙළි වුව ද සිසුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා තුළින් අනාවරණය වූවේ එම සාධකය ඉතා ප්‍රබල ලෙසින් සිසුන්ගේ විෂයයන් තේරීමට බලපෑම් සිදු කොට ඇති බවයි.

ශිෂ්‍ය වෘත්තීය අපේක්ෂණ පිළිබඳ සොයා බැලීමේදී සිසුවා අයත් පවුල්වල සමාජ ආර්ථික පසුබිම, සමාජ සාධක සහ සිසුවා සම්බන්ධ සාධක විමසීමට ලක්කරන ලදි. එහිදී ශිෂ්‍ය වෘත්තීය අපේක්ෂණවලට සමාජ සාධකවල බලපෑම ඉතා අවම මට්ටමකින් බලපා ඇති බව හෙළි වූ අතර ශිෂ්‍ය වෘත්තීය අපේක්ෂණවලට බෙහෙවින් ම බලපෑම් සිදු කර ඇත්තේ සිසුවා සම්බන්ධ සාධක බව අනාවරණය විය. පුම්තිරි බව, පාසල් වර්ගය, ග්‍රාමීය නාගරික බව ආදියෙහි වෙනසක් නොමැතිව නියැදි දෙකෙහි ම සිසුන් ගුරු වෘත්තිය පිළිබඳ අපේක්ෂා තබා සිටින බව හෙළිදරව් විය.

මේ අනුව ග්‍රාමීය සහ නාගරික යන නියැදි දෙකෙහිදීම සිසුන් තෝරා ගෙන ඇති විෂයයන් එම සිසුන් අපේක්ෂා කරන වෘත්තිය සමඟ මනා සම්බන්ධතාවක් ඇති බව අනාවරණය විය.